සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

# ක්‍රිස්තු ධර්මය

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජේසුතුමා මුල් ගෝලයන් කැඳවූයේ,
    (1) ගෙනසෙරෙත් විලේදී (2) ජොර්දාන් ගඟ අසලදී
    (3) නාසරෙත් සිනගෝගයේදී (4) ජෙරුසලම් දේවමාලිගාවේ දී

02. ඊශ්‍රායෙල් ජනයාට පාළුකරයේ දී ආහාර පිණිස ලබා දුන්නේ,
    (1) රොටී ය. (2) මී පැණි ය. (3) පාන් ය. (4) මන්නා ය.

03. දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කර පාපය තෝරා ගැනීම නිසා මනුෂ්‍යයාට හිමිවූයේ,
    (1) ජීවනයයි. (2) මරණයයි. (3) පාපයයි. (4) ගැලවීමයි.

04. දේව දරුවන් වන ඔබ තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
    (1) ආඩම්බරකම ය. (2) වංචාවය ය. (3) නිහතමානීකම ය. (4) අකීකරුකම ය.

05. කිතුණු දරුවන් ලෙස අපට වැරදි කරන අයට අප,
    (1) වෛර කළ යුතුය. (2) රණ්ඩුවට යා යුතුය.
    (3) සමාව දිය යුතුය. (4) ප්‍රතික්ෂේප කළ යුතුය.

06. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය. යනුවෙන් පැවසූ ශ්‍රාවකයා වන්නේ,
    (1) ජාකොබ් ය. (2) පේදුරු ය. (3) යොහාන් ය. (4) යුදස් ය.

07. නායකත්වය දැරීමට අවශ්‍ය වඩාත් වැදගත්ම ගුණාංගය වන්නේ,
    (1) කැපවීමේ ප්‍රේමයයි. (2) පූජා වීමේ ප්‍රේමයයි.
    (3) නිහතමානී ප්‍රේමයයි. (4) ආධ්‍යාත්මක ප්‍රේමයයි.

08. "සුදු අම්මා" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූයේ කවුරුන්ද?
    (1) තෙරේසා මව්තුමිය ය. (2) ජොයිස් ද සිල්වා තුමිය ය.
    (3) ඉව්ලින් කානි තුමිය ය. (4) ෆලෝරන්ස් නයිටිංගේල් තුමිය ය.

09. ජේසුස් වහන්සේ සාකෙවුස්ගේ නිවසට පැමිණීමෙන් ඔහුගේ ජීවිතය වෙනස් විය. ඔහු දිළිඳුන්ට හා අයුතු ලෙස ගත් අයට දීමට පොරොන්දු වූ ප්‍රමාණයන වන්නේ,
    (1) සතර ගුණයක් සහ දෙකෙන් කොටසකි. (2) දෙකෙන් කොටසක් හා සතර ගුණයකි.
    (3) සතර කොටසක් හා සතර ගුණයකි. (4) දෙකෙන් කොටසක් හා තුන් ගුණයකි.

10. රෝම අධිරාජ්‍යයට සේවය කළ ධනවත් ප්‍රධානියකු වන්නේ,

(1) යුදස් ය. (2) යුදස් ස්කාරියොත් ය.

(3) ජාකොබ් ය. (4) සාකෙවුස් ය.

11. අධ්‍යාත්මික ලෙස කිතුණු දිවිය රස ගන්වන ඵල,

(1) 3 කි. (2) 6 කි. (3) 9 කි. (4) 12 කි.

12. තහනම් කරන ලද ගසේ ගෙඩි සංකේතවත් කරනුයේ,

(1) නපුරයි. (2) පාපයයි. (3) ආශිර්වාදයයි. (4) ශරීරයයි.

13. "තෝරාගත් සෙනග" යනුවෙන් අදහස් කළේ,

(1) ජාකොබ්ගේ පෙළපත ය. (2) ආබ්‍රහම්ගේ පෙළපත ය.

(3) දාවිත්ගේ පෙළපත ය. (4) ජෝසප්ගේ පළෙපත ය.

14. කුරුණෑගල දියෝකීසියේ තුන්වන බිෂොප්ධූරය දැරුවේ,

(1) කනගරත්නම් පියතුමා ය. (2) සෝමසිරි කුමාරදාස පියතුමා ය.

(3) මර්සලින් ජයකොඩි පියතුමා ය. (4) ඇන්ඩෘ කුමාරගේ පියතුමා ය.

15. ජේසුස් වහන්සේ මැරුණු යෞවනයා උත්ථාන කිරීමෙන් සැනසීම ලබා දුන්නේ,

(1) මාර්තාට ය. (2) මග්දලායේ මරියාට ය.

(3) නායින් නුවර වැන්දඹුවට ය. (4) මහලේ රෝගී ස්ත්‍රීයට ය.

16. කිතුණු අපගේ ජීවිතවල ගන්නා වැදගත් තීරණවලදී අප,

(1) විමසිලිමත් විය යුතුය. (2) ජයගත යුතුය.

(3) යහළුවන් සමග සාකච්ඡා කළ යුතුය. (4) යාච්ඤා කළ යුතුය.

17. ජාතක සමගිය හා සංහිදියාව උදෙසා කැපවීමෙන් කටයුතු කළේ,

(1) සෝමසිරි කුමාරදාස පෙරේරා දේවගැතිතුමා ය.

(2) ඩොනල්ඩ් කනගරත්නම් අනුනායක තුමා ය.

(3) ඇන්ඩෘ කුමාරගේ හිමිපාණෝ ය.

(4) ඉව්ලින්කානි තුමිය ය.

18. ශුද්ධාත්ම ඵලයක් නොවන්නේ මින් කුමක්ද?

(1) ප්‍රීතිය (2) මෘදුකම

(3) විශ්වාසවන්තකම (4) ආත්මාර්ථකාමීත්වය

19. කිතුණු දරුවෙකු ලෙස අප සැම විටම කළ යුත්තේ,

(1) තම මතයට අනුව ක්‍රියා කිරීමයි.

(2) දේව කැමැත්තට අනුව ක්‍රියා කිරීමයි.

(3) දේශපාලන මතවලට අනුව ක්‍රියා කිරීමයි.

(4) තම මිතුරන්ගේ මත අනුව ක්‍රියා කිරීමයි.

20. "තවත් පව් නොකරන්න" ජේසු තුමා පැවසුවේ,

(1) මරියාට ය. (2) මාර්තාට ය.

(3) වැන්දඹු ස්ත්‍රීයට ය. (4) පව්කාර ස්ත්‍රීයට ය.

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) ගෙතසෙරත් විල හඳුන්වන තවත් නමක් ලියන්න.
(ii) දේව මැවිල්ල ආරක්‍ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් දෙකක් ලියන්න.
(iii) අපගේ පාපයන්ට කමාව ලබා දෙන්නේ කවුරුන්ද?
(iv) මෙළොව ඇති විශ්මිත නිර්මාණ අතර අසමසම නිර්මාණය පෙන්වා දෙන්න.
(v) සංහිඳියාවේ නිවස ජනතා සේවය උදෙසා ලබා දුන්නේ කවුරුන්ද?
(vi) ජුදා සමාජයේ කොන් කරන ලද ජන කණ්ඩායම් දෙකක් නම් කරන්න.
(vii) "පවක් නැති තැනැත්තා පළමු කොට ඇයට ගලක් ගසන්න." යන ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද?
(viii) දහම්පාසල් දරුවෙකු ලෙස ඉරුදින දිව්‍ය පූජාවට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න.
(ල. 2 x 8 = 16)

02. (i) ශුද්ධාත්ම ඵල යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)
(ii) ශුද්ධාත්ම ඵල තුනක් ලියන්න. (ල. 03)
(iii) එම ඵල අප ජීවිත තුළ වර්ධනය කරගතහැකි ආකාර කීපයක් ලියන්න. (ල. 06)

03. (i) දේව කැඳවීම යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 02)
(ii) දේව සේවය සඳහා කැඳවීම ලබන පුද්ගලයන් තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ල. 03)
(iii) ඔබට දේව කැඳවීමක් ලැබුණොත් ඔබ ක්‍රියා කරන ආකාර තුනක් ලියන්න. (ල. 06)

04. (i) ඉශ්‍රායෙල් ජනතාව වහල් බවින් මුදවා ගැනීමට දෙවියන් වහන්සේ විසින් තෝරා ගත්තේ කවුරුන්ද? (ල. 02)
(ii) ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය වීම පාලනය කිරීම සඳහා පාරාවෝ රජතුමා ගත් ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 03)
(iii) ජීවිතේ ඔබ ලැබූ සියලු ආශිර්වාද ගැන ප්‍රකාශ කරමින් ස්තුති කිරීමේ යාච්ඤාවක් ලියන්න. (ල. 06)

05. (i) නායින් නුවර වැන්දඹුවට ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ කුමක්ද? (ල. 02)
(ii) මරණින් නැගිටවනු ලැබූ පුත්‍රයා නැවත සිය මෑණියන්ට භාරදීම තුළින් ලැබෙන පණිවිඩ තුනක් ලියන්න. (ල. 03)
(iii) දුකට වේදනාවට පත් වූ ඔබේ යහළුවෙකු වෙනුවෙන් කළ හැකි කාර්යයන් තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල. 06)

06. (i) මෑත කාලීන ධර්මදූතිකාවන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
(ii) මාර්තා සහ මරියා කථාවේ දී මරියා තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)
(iii) දෙවිපියාණන් වහන්සේට සමීප වීම සඳහා ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 06)

07. (i) ජේසුස් වහන්සේ දරුවන් අගය කළ අවස්ථාවක් ලියන්න. (ල. 02)
(ii) වර්තමාන සමාජය තුළ කිතුණු අප වෙත පැමිණෙන පරීක්ෂාවන් තුනක් ලියන්න. (ල. 03)
(iii) එම පරීක්ෂාවන්ට මුහුණ දීමට ශක්තිය ඉල්ලා කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 4 ) | 03. ( 2 ) | 04. ( 2 ) | 05. ( 3 ) | 06. ( 2 ) | 07. ( 2 ) | 08. ( 3 ) | 09. ( 2 ) | 10. ( 4 ) |
| 11. ( 3 ) | 12. ( 2 ) | 13. ( 2 ) | 14. ( 4 ) | 15. ( 3 ) | 16. ( 4 ) | 17. ( 1 ) | 18. ( 4 ) | 19. ( 2 ) | 20. ( 4 ) |

## II කොටස

01. (i) ගලීල මුහුද / තිබේරියස් මුහුද

(ii) පාසල අවට පරිසරය පිරිසිදුව පවත්වාගෙන යාම / නාවස අවට පරිසරය සුරැකීම / ශ්‍රමදාන සඳහා දායක වීම. / ගහකොළ සතුන් ආරක්ෂා කර ගැනීම.

(iii) ජේසුස් වහන්සේ

(iv) මිනිසා

(v) ඉව්ලින් කානි තුමිය.

(vi) අයකැමියන් / දිළින්දන් / එඬේරු

(vii) ජේසුස් වහන්සේ

(viii) ලියා ඇති ආකාරයට ලකුණු පරිනමන්න. (ල. 2 x 8 = 16)

02. (i) ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපට දී තිබෙන ඵලයන් (ල. 03)

(ii) ප්‍රේමය / ප්‍රීතිය / සාමය / ඉවසීම (ල. 03)

(iii) කිසිදු ප්‍රති උපකාරයක් බලාපොරොත්තු නොවී අන් අයට සැලකීම. / විරුද්ධවාදිකම් නොකර දරා ගැනීම. / සියලු දෙනාටම කරුණාව දැක්වීම. / යටහත්ව අන් අය කෙරෙහි සංවේදී වීම. ලියා ඇති ආකාරයට ලකුණු පිරිනමන්න. (ල. 06)

03. (i) දේව මෙහෙවරෙහි විශේෂ කාර්යයන් උදෙසා දෙවියන් වහන්සේගේ තෝරා ගැනීම දේව කැඳවීමයි. (ල. 03)

(ii) නිහතමානීකම, කීකරුකම, ඇඳහිල්ල (ල. 03)

(iii) ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (i) මෝසෙස් (ල. 03)

(ii) ඉශ්‍රායෙල් පිරිමි දරුවන් උපතේදී ම විනාශ කිරීම.
හෙබ්‍රව්වරුන්ට උපදින සෑම පිරිමි දරුවෙක්ම නයිල් ගඟට විසි කිරීම. (ල. 03)

(iii) ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) 'හැඬීම නවත්වන්නැයි' වදාළ සේක. (ල. 03)

(ii) ජුදා කාන්තාව මුහුණ දුන් අභියෝග වලට සහනයක් වූ බව
වැන්දඹුව කෙරෙහි අනුකම්පා වීම.
ජේසුස් වහන්සේ මරණය අභිබවා ක්‍රියා කරන බව (ල. 03)

(iii) පිළිතුරු ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) එලීසා ඇග්නිව් සහ ජොයිස් ද සිල්වා (ල. 03)

(ii) ජේසුස් වහන්සේගේ පාමුල සිටීමට ප්‍රිය කළා ය.
උන්වහන්සේගේ වචනය ඇසීමට යොමු වීම.
අත්‍යවශ්‍ය දේ පමණක් තෝරා ගැනීම. (ල. 03)

(iii) පිළිතුරු ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 06)

07. (i) මීමැස්මොර වැලඳුන දරුවාට ආදරය කොට සුවය ලබා දීම.
යායිරස්ගේ දියණිය වෙනුවෙන් ආදරයෙන් ක්‍රියා කිරීම. (ල. 03)

(ii) පිළිතුරු ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) පිළිතුරු ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල. 06)